**සීමාසහිත ක්‍රිකට් ආධාර (ඇපකාර) සමාගම - 2019**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය ව්‍යාචනය**

සීමාසහිත ක්‍රිකට් ආධාර (ඇපකාර) සමාගමේ ("සමාගම") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**සමාගමේ** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, **සමාගමේ** අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය **සමාගම** ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා **සමාගමේ** අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

**සමාගමේ** මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාර, වාර්ෂික සහ කාලානුරූපී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදි, සමාගමේ සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ.

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | අයිතමය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ නිදන්ගත වකුගඩු රෝග සඳහා අරමුදල් රැස්කිරීමේ වැඩසටහනෙන් එකතු කරන ලද මුළු මුදල | 3,295,000 | මුද්‍රණය කරන ලද ප්‍රවේශපත්‍ර සංඛ්‍යාව, ප්‍රවේශපත්‍රවල මිල, වැඩසටහනේ පිරිවැය සහ වැඩසටහනෙන් අපේක්ෂිත ආදායම, වැඩසටහනේ කාලසීමාව, සිදුවීම් කළමනාකරණ සමාගම තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය සහ ඔවුන්ගේ කාර්යභාරය, සිදුවීම් කළමනාකරණ සමාගම සඳහා ගෙවීම, විකුණූ ප්‍රවේශපත්‍ර ගණන පිළිබඳ විස්තර, වෙන්දේසි කළ භාණ්ඩ පිළිබඳ විස්තර යනාදිය. | කොවිඩ් -19 වසංගතය හේතුවෙන් ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි විය | එකතු කරන ලද මුළු අරමුදල සත්‍යාපනය කිරීමට විගණනය වෙත ප්‍රමාණවත් ලෙස ලේඛන සපයා තිබිය යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ නිදන්ගත වකුගඩු රෝග අරමුදල් රැස්කිරීමේ වැඩසටහන සඳහා දරන ලද මුළු වියදම | 12,443,706 | ගෙවීම් වවුචර ඉන්වොයිසි, බැංකු තැන්පතු පත්‍රිකා, විස්තරාත්මක වාර්තා | කොවිඩ් -19 වසංගතය හේතුවෙන් ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි විය | වැඩසටහන සඳහා දරන ලද මුළු වියදම සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ලේඛන ප්‍රමාණවත් ලෙස සපයා තිබිය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 සහ 2017 වසරවලට අදාළ අභ්‍යන්තර විගණන ගාස්තු රු. 514,653 ක් 2019 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | 2016 සහ 2017 වසර සඳහා අභ්‍යන්තර විගණන ගාස්තු සඳහා ඉන්වොයිසිය ලැබී ඇත්තේ අදාළ වර්ෂවල මූල්‍ය ගිණුම්ව කටයුතු අවසන් කිරීමෙන් පසුවය, එබැවින් ප්‍රතිපාදන සිදු කළ නොහැකි වූ අතර ඉන්වොයිසිය ලැබුණු වර්ෂයේදී එය ගිණුම්ගත කර ඇත.. | 2016 සහ 2017 වසරවලට අදාළ විගණන ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.5.3 මූල්‍ය ප්‍රකාශන සැකසීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 ජනවාරි 28 දිනැති ශ්‍රී ලංකා ක්‍රිකට් විධායක කමිටුව විසින් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන **සීමාසහිත** ක්‍රිකට් ආධාර (ඈපකාර) සමාගමේ ක්‍රියාකාරිත්වය අත්හිටුවීමට අනුමැතිය ලබා දී තිබුණි, එම තීරණය ගන්නා විට සමාගම සතුව තිබූ මුළු වත්කම් ප්‍රමාණය රු.5,014,680 ක් සහ මුළු වගකීම් ප්‍රමාණය රු. 710,689 ක් විය. සියලුම වගකීම් 2022 දෙසැම්බර් 30 වන දින පියවා තිබුණද, රු. 89,850 ක බැංකු ශේෂය මේ දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට පවරා නොතිබුණි. එමෙන්ම, සීමාසහිත ක්‍රිකට් ආධාර (ඈපකාර) සමාගමේ මෙහෙයුම් නවතා වසර දෙකකට වැඩි කාලයක් ගතවී ඇතත්; ඈවර කිරීමේ ක්‍රියාවලිය මේ දක්වා අවසන් කර නොතිබුණි. | සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට ගෙවිය යුතු ගාස්තු/ගාස්තු වැනි ඈවර කිරීමේ ක්‍රියාවලියේදී පැන නගින ඕනෑම අහඹු වියදම් පියවා ගැනීම සඳහා ශේෂයක් රඳවා තබා ගන්නා ලදී. කෙසේ වෙතත්, ඉතිරි මුදල රු. 89,850 ශ්‍රී ලංකාවේ ගිණුමකට මාරු කිරීම සඳහා චෙක්පතක් ලබාගෙන ඇත. | ඈවර කිරීමේ ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,496,213 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 546,017 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 950,197 ක ප්‍රගතියක් නිරීක්ෂණය විය. මෙම ප්‍රගතියට රු. 4,250,000 න් ආදායම් වැඩිවීම හා රු. 3,299,803 න් වියදම් වැඩිවීම හේතු වී තිබුණි